# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2012/51 - 2017 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2017.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/82 (II)

### 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 13, 14, 15, 16 සහ 18 වන වගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 32 වන වගන්තිය යටතේ ජනාධිපති සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති සහ
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2017 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1983 සැප්තැම්බර් මස 02 වන දින සහ අංක 260/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද හා කලින් කල සංශෝධිත 1982 අංක 1 දරන වෙරළ සංරක්ෂණ නියෝග පහත පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 7 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''7. මේ පනතේ 18 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙහි උපලේඛනයේ ''ඈ'' ආකෘතියේ දැක්වෙන අදාළ ගාස්තු සමග එහි ''ආ'' ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.''.

(2) එහි 8 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''8. මේ පනතේ 18 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් පැවරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම ''ඉ'' ආකෘතියේ දැක්වෙන අදාළ ගාස්තු සමග ඉදිරිපත් කළ යුතු ය.''.

(3) එහි උපලේඛනයේ ''ඈ'' ආකෘතිය වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන් :-


1A - PG 3480 — 1007 (2017/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"ඇ" ආකෘතිය

බලපත්‍ර සහ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා සඳහා අයදුම්පත් ගාස්තු

| *ගාස්තු වර්ගය* | *ගාස්තුව (රු.)* |
|---|---|
| **(1) සාමාන්‍ය බලපත්‍ර ගාස්තු** | |
| **(අ) ගොඩනැගිලි ඉදිකිරීම භූමි ප්‍රමාණය** | |
| ව.අ 1000 ට අඩු | 500.00 |
| ව.අ 1001 - 3000 ත් අතර | 2,000.00 |
| ව.අ 3001 - 5000 ත් අතර | 4,000.00 |
| ව.අ 5001 - 10000 ත් අතර | 10,000.00 |
| ව.අ 10001 ට වැඩි | 25,000.00 |
| **(ආ) වෙනත් ඉදිකිරීම්** | |
| දූල් වැට, මායිම් තාප්ප ඉදිකිරීම් සඳහා | 500.00 |
| වෙරළ කලාපය තුළ දන්වීම් පුවරු සවිකිරීම සඳහා | 500.00 |
| විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා | 20,000.00 |
| මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සහ ජලජීවී වගා ව්‍යුහ ඉදිකිරීම් සඳහා බලපත්‍ර ගාස්තු | 5000.00 |
| **(2) විශේෂ බලපත්‍ර ගාස්තු** | |
| **(අ) මූලික පාරිසරික පරීක්ෂණයක් සඳහා පරිපාලන ගාස්තු** | |
| * මහා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 5 ට වැඩි) | 150,000.00 |
| * කුඩා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 5 ට අඩු) | 100,000.00 |
| **(ආ) පාරිසරික බලපෑම් ඇගයීමක් සඳහා පරිපාලන ගාස්තු** | |
| * මහා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 50 ට වැඩි) | 500,000.00 |
| * කුඩා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 50 ට අඩු) | 250,000.00 |
| **(3) වෙනත් බලපත්‍ර කාණ්ඩ** | |
| (අ) වැලි ඉවත් කිරීම සඳහා | |
| * කියුබ් 4 ක් හෝ ඊට අඩුවෙන් - කියුබ් 01 ක් සඳහා | 200.00 |
| * කියුබ් 4 ට වැඩි - කියුබ් 01 සඳහා | 500.00 |
| (ආ) ඛනිජ වැලි සඳහා කැණීම් හෝ හැරීමේදී - කියුබ් 01 ක් සඳහා | 500.00 |
| (ඇ) වෙරළ කලාපයෙන් සිප්පි කටු ඉවත් කිරීමේදී (කියුබ් එකක උපරිමයකට යටත්ව) කියුබ් 1 ක් සඳහා | 1000.00 |
| (ඈ) ඉඩම් ප්‍රතිසංස්කරණය, පිරවීම හෝ හැරීම සඳහා ගාස්තු | |
| ව.මී 150 ට අඩු ප්‍රදේශයක් සඳහා | 5000.00 |
| ව.මී 151 - 300 අතර ප්‍රදේශයක් සඳහා | 10,000.00 |
| ව.මී 301 ට වැඩි වන විට සෑම වර්ග මීටර් එකකට | 60.00 බැගින් |
| (ඉ) ගිලුණු නැව්, යාත්‍රා ආදී අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමේදී වෙරළ කලාපය භාවිත කිරීම | 100,000.00 |
| (ඊ) වෙරළ කලාපයේ ඉඩම් සඳහා මූලික නිර්දේශ ලබා ගැනීම | 500.00 |
| (උ) ඉදිකිරීම් සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම | 500.00 |
| (ඌ) වෙරළ හෝ ගංගා ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම (දිග මීටර් එකක් සඳහා) | 1,000.00 |
| (එ) පාලම් හෝ ජැටි ඉදිකිරීම සඳහා බලපත්‍ර ගාස්තු | |
| පාලමක් ඉදිකිරීමට | 25,000.00 |
| බෝක්කුවක් ඉදිකිරීමට | 10,000.00 |
| සපත්තු පාලමක් ඉදිකිරීමට | 5,000.00 |
| (ඒ) විශේෂ අවස්ථා සඳහා වෙරළ භාවිත කිරීමේදී වෙරළ නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලබාගන්නා ආපසු නොගෙවන ගාස්තුව (එක් දිනක් සඳහා) | 10,000.00 බැගින් |

(4) එහි උපලේඛනයේ ''ඈ'' ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන ආකෘති ඇතුළත් කිරීමෙන් ඃ-

''ඈ'' ආකෘතිය

බලපත්‍ර අලුත් කිරීම සඳහා ගාස්තු

| *ගාස්තු වර්ගය* | *ගාස්තුව (රු.)* |
|---|---|
| **(1) සාමාන්‍ය බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු** | |
| **(අ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භූමි ප්‍රමාණය** | |
| ව.අ 1000 ට අඩු | 250.00 |
| ව.අ 1001 - 3000 ත් අතර | 1,000.00 |
| ව.අ 3001 - 5000 ත් අතර | 2,000.00 |
| ව.අ 5001 - 10000 ත් අතර | 5,000.00 |
| ව.අ 10001 ට වැඩි | 12,500.00 |
| **(ආ) වෙනත් ඉදිකිරීම්** | |
| දැල් වැට/මායිම් තාප්ප ඉදිකිරීම් | 250.00 |
| වෙරළ කලාපය තුළ දැන්වීම් පුවරු සවිකිරීම සඳහා | 250.00 |
| විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා | 10,000.00 |
| මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සහ ජලජීවී වගා ව්‍යුහ ඉදිකිරීම් සඳහා බලපත්‍ර ගාස්තු | 2,500.00 |
| **(2) විශේෂ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු** | |
| **(අ) මූලික පාරිසරික පරීක්ෂණයක් සඳහා** | |
| * මහා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 5 ට වැඩි) | 75,000.00 |
| * කුඩා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 5 ට අඩු) | 50,000.00 |
| **(ආ) පාරිසරික බලපෑම් ඇගයීමක් සඳහා** | |
| * මහා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 50 ට වැඩි) | 250,000.00 |
| * කුඩා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 50 ට අඩු) | 125,000.00 |

''ඉ'' ආකෘතිය

බලපත්‍ර පැවරීම සඳහා ගාස්තු

| *ගාස්තු වර්ගය* | *ගාස්තුව (රු.)* |
|---|---|
| **(1) සාමාන්‍ය බලපත්‍ර පැවරීමේ ගාස්තු** | |
| **(අ) ගොඩනැගිලි ඉදිකිරීම් භූමි ප්‍රමාණය** | |
| ව.අ 1000 ට අඩු | 250.00 |
| ව.අ 1001 - 3000 ත් අතර | 1,000.00 |
| ව.අ 3001 - 5000 ත් අතර | 2,000.00 |
| ව.අ 5001 - 10000 ත් අතර | 5,000.00 |
| ව.අ 10001 ට වැඩි | 12,500.00 |
| **(ආ) වෙනත් ඉදිකිරීම්** | |
| දැල් වැට, මායිම් තාප්ප ඉදිකිරීම් සඳහා | 250.00 |
| වෙරළ කලාපය තුළ දැන්වීම් පුවරු සවිකිරීම සඳහා | 250.00 |
| විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා | 10,000.00 |
| මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන, ජලජීවී වගා ව්‍යුහ ඉදිකිරීම් සඳහා බලපත්‍ර ගාස්තු | 2,500.00 |
| **(2) විශේෂ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු** | |
| **(අ) මූලික පාරිසරික පරීක්ෂණයක් සඳහා** | |
| * මහා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 5 ට වැඩි) | 75,000.00 |
| * කුඩා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 5 ට අඩු) | 50,000.00 |
| **(ආ) පාරිසරික බලපෑම් ඇගයීමක් සඳහා** | |
| * මහා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 50 ට වැඩි) | 250,000.00 |
| * කුඩා පරිමාණයේ ව්‍යාපෘති (ඇමරිකානු ඩොලර් මිලියන 50 ට අඩු) | 125,000.00 |

04 - 423

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.